lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gaz

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026.11.16** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

### 1. කනිෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 01)

**1.1 වැටුප් පරිමාණය**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 54,560- 3x680/ 10x800/ 4x1,190 - 69,360/-වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 96,000.00 පමණ වේ.)

**1.2 වයස් සීමාව**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතු ය.

**1.3 සුදුසුකම්**

1.3.1 **අධ්‍යාපන:** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම

සහ

**වෘත්තීය:** පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවේ පළමුවැනි කොටස සම්පූර්ණ කර තිබීම

(ලබා ඇති උපාධිය පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ උපාධියක් නම්, වෘත්තීය සුදුසුකම් අනිවාර්ය නොවේ).

සහ

**පළපුරුද්ද:** ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු මහජන පුස්තකාලයක/ පාර්ලිමේන්තු පුස්තකාලයේ පුස්තකාල සහකාර තනතුරක වසර තුනක (03) පළපුරුද්ද

හෝ

1.3.2 **අධ්‍යාපන:** අ.පොස. (උසස් පෙළ) විභාගය (පැරණි විෂය නිර්දේශය) විෂයයන් හතරකින් (04)/ (නව විෂය නිර්දේශය) විෂයයන් තුනකින් (03) එකවර සමත් වී තිබීම.

සහ

සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අ.පොස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

**වෘත්තීය:** පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක II වැනි මට්ටම සම්පූර්ණ කර තිබීම

සහ

**පළපුරුද්ද:** ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු මහජන පුස්තකාලයක/ පාර්ලිමේන්තු පුස්තකාලයේ පුස්තකාල සහකාර තනතුරක වසර පහක (05) පළපුරුද්ද.

හෝ

1.3.3 **අධ්‍යාපන:** සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අ.පොස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

**වෘත්තීය:** පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක III වැනි මට්ටම සම්පූර්ණ කර තිබීම.

සහ

**පළපුරුද්ද:** ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු මහජන පුස්තකාලයක/පාර්ලිමේන්තු පුස්තකාලයේ පුස්තකාල සහකාර තනතුරක වසර හතක (07) පළපුරුද්ද.

### 1.4 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක කුසලතාව මඟිනි.

### 1.5 ඇගයීමේ පටිපාටිය

1.5.1 **ලිඛිත පරීක්ෂණය:** රැකියා කාර්යභාරය සහ වගකීම සම්බන්ධව අයදුම්කරුගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බලනු ලබන අතර, ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100).

1.5.2 **සම්මුඛ පරීක්ෂණය:** පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

1.5.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත නිර්ණායකයන් අනුව ලකුණු ලබා දෙනු ලැබේ. මෙහි දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියයකි (100):

| | නිර්ණායක |
|---|---|
| i | අමතර අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් |
| ii | පරිගණක සාක්ෂරතාව |
| iii | සේවා පළපුරුද්ද |
| iv | සන්නිවේදන කුසලතාවය හා භාෂා නිපුණත්වය |
| v | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව |

## 2. ගෘහභාණ්ඩ ඔපකරු තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 01)

### 2.1 වැටුප් පරිමාණය

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.47,240- 9x540 /10 x 590 /3x680 - 60,040/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 87,000/- පමණ වේ).

### 2.2 වයස් සීමාව

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

### 2.3 සුදුසුකම්

2.3.1 **අධ්‍යාපන:** සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද, ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

සහ

lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gaz

**වෘත්තීය:** වඩු ශිල්ප (ගෘහභාණ්ඩ ඔපකරු) ක්ෂේත්‍රයට අදාළව NVQ III සහතිකයක් ලබා තිබීම.

සහ

**පළපුරුද්ද:** පිළිගත් ආයතනයක ගෘහභාණ්ඩ ඔපකරණ ක්ෂේත්‍රයේ තනතුරක අවම වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

2.3.2 **අධ්‍යාපන:** සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද, ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

සහ

**පළපුරුද්ද:** පිළිගත් ආයතනයක ගෘහභාණ්ඩ ඔපකරණ ක්ෂේත්‍රයේ තනතුරක අවම වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

**2.4 බඳවා ගැනීමේ ක්‍රමය**

වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක කුසලතාවය මඟිනි.

2.4.1 **වෘත්තීය පරීක්ෂණය:** ගෘහභාණ්ඩ ඔපකරණ ක්ෂේත්‍රයට අදාළ කුසලතා පරීක්ෂා කරනු ලැබේ.

2.4.2 **සම්මුඛ පරීක්ෂණය:** වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. මෙහි දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| | **නිර්ණායක** |
|---|---|
| i. | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| ii. | විෂය දැනුම |
| iii. | පළපුරුද්ද |
| iv. | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**3. ආහාරපාන සහායක තනතුර (පුරප්පාඩු සංඛ්‍යාව - 08)**

**3.1 වැටුප් පරිමාණය**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240-9x 540/10x 590/3 x 680- 60,040 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 90,000.00 පමණ වේ).

**3.2 අධ්‍යාපන සුදුසුකම්**

සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී සිටීම.

**3.3 වෘත්තීය සුදුසුකම්**

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) / ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA)/ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) හෝ ඒ හා සමාන වෘත්තීය පුහුණු ආයතනයක පාඨමාලා කාලය වසරකට නොඅඩු මූලික හෝජනාගාර සේවා පාඨමාලාවක් / ආහාරපාන සේවා පාඨමාලාවක් හදාරා එය සාර්ථකව නිමකොට තිබීම.

**3.4 පළපුරුද්ද**

ඉහත 3.2 සහ 3.3 හි සඳහන් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, තරු පංතියේ හෝටලයක/පිළිගත් ආයතනයක හෝජනාගාර සේවක/ ආහාරපාන සහායක තනතුරක වසර දෙකකට නොඅඩු කාලයක් සේවය කර තිබීම.

lk-gazette.lk-gazette.lk-gazette.

**5.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (**මුල් පිටපත් නොවේ**) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**6.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**7.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**8.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර හෝ කරුණක් වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**9.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන අයදුම්පත් (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**10.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කුෂානි රෝහණදීර
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
2026 ඔක්තෝබර් මස .....

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED